2015 මධ්‍ය වාර පරීක්ෂණය 8 ශ්‍රේණිය නර්තනය පිළිතුරු පත්‍රය

I - කොටස - (ලකුණු 40 යි.)

01	1	02	1	03	3	04	2	05	3	06	2	07	1	08	3
09	1	10	1	11	2	12	1	13	3	14	4	15	2	16	✓
17	✗	18	✓	19	✗	20	✓	21	4 වෙනි ගොඩ සරඹය						

22 තිත් / තෙයි 23 තානම 24 බංකු රබානෙන් 25 කඩිප්පු

II - කොටස

01

02 (1) අවකාශ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්, පොදු අවකාශ හා පුද්ගල අවකාශය යනුවෙනි. පොදු අවකාශයේ දි නර්තනයට සමූහයක් එකතු වේ. පුද්ගල අවකාශයේ දී ඒකලව තනි පුද්ගලයෙක් වේදිකාව භාවිතා කරයි. නර්තනයේ දී වේදිකාව භාවිතයේ දී දිසා 10 ක් ද තල 3 ක් ද බෙදා වෙන් කර තිබේ.

(2) දිසා 10

ඉදිරිපද දිශාව / පසුපස දිශාව / වට දිශාව / දකුණු දිශාව / ඉදිරිපස දකුණු දිශාව / පිටුපස දකුණු දිශාව / ඉදිරිපස වට දිහාව / පිටුපස වට දිශාව / උඩ දිශාව / යට දිශාව

තල 3

ඉහළ තලය / මැද තලය / පහළ තලය

03 (1) ගැමි නැටුම් යනු සෑම රටකටම ආවේනික වශයෙන් ගැමි ජනතාව අතර ප්‍රචලිත ජන කලාවකි. එහි ලක්ෂණ අතර සරල බව, එම කම, උපකරණ භාවිතය, සරල රංග වස්ත්‍රාභරණ හා වේෂ නිරූපණ ක්‍රමයක් තිබීම / සාමූහිකව නර්තනයේ යෙදීම ආදිය පෙන්වා දිය හැකිය. ලංකාවට ආවේණික ගැමි නැටුම් අතර කළගෙඩි නැටුම, කුළු නැටුම, ලී කෙළි නැටුම, මෝල්ගස් නැටුම්, රබන් නැටුම් ආදිය වේ.

විනෝදාස්වාදය ලබාගැනීමට හා පාලුව, කාන්සිය දුරුකර ගැනීමට ගැමියන් සරලව මෙම නර්තන සකසාගෙන ඇත.

(2) ඇත සිටන් එන්නෙ සෙල්ලි ලෙස්සියේ (කුළු නැටුම් සඳහා ඉගැන්වූ කවියක පද 4 සහිතව ලියා තිබිය යුතුය.)

04 අනුරාධපුර යුගය සම්බන්ධව කරුණු වංශකතා, සාහිත්‍ය කෘති, සෙල්ලිපි, රූකම් ආදිය මගින් ලබාගත හැකිය.

පණ්ඩුකාභය රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් පැවැත්වූ බව මහා වංශයේ කියැවේ.

දුටුගැමුණු රජු 16000 ක් නළඟනන් පිරිවරාගෙන රුවන්වැලි සෑය බඳින උත්සවයට ගිය බව වංශකතාවේ එයි.

සැස්සෝරුව හා කොරවක්ගල සෙල්ලිපියේ එන ''නටන ගෘහපතියාගේ දුව විසින් පවරා දෙන ලදී'' යන පාඨය සඳහන් වීම.

කුට්ටම් පොකුණේ අඩිතාලම යටින් නිළියකගේ ලෝකඩ රූපයක් සොයා ගැනීම.

ලෝවාමහාපායේ කණු හිස්වලින් වීණා වාදකයින් හා තවත් බෙර වාදකයින්ගේ රූකම් හමුවීම.

ඉහත නිදසුන් මගින් අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳව රාජ්‍ය අනුග්‍රහය ලැබුණු අයුරු මෙන්ම කාන්තාවන්ගේ දායකත්වයක් තිබුණු බව ද වාද්‍ය භාණ්ඩවල භාවිතය ආදිය ගැනද තොරතුරු හමුවේ.

05 (1)